

# පුංචි සදුනී

හිරන්‍යා යසස්වි වීරසේකර.

*“ අපි දිනකට කොට හරි පුංචි හෝ උදව්වක් කරමු.”*

# පුංචි සඳුනි

## කතෘ

ඩබ්.එම්.හිරන්‍යා යසස්වි වීරසේකර

**ISBN 978-624-206-644-8**

(Bar Code- 9 786242 066448)

## චිත්‍ර

ඩබ්.එම්.හිරන්‍යා යසස්වි වීරසේකර

## කෘතියේ අයිතිය

ඩබ්.එම්.හිරන්‍යා යසස්වි වීරසේකර


## කතෘගේ වෙනත් කෘති

කුරුළු පැටික්කී

## කෘතිය පළකරන දිනය

2023 නොවැම්බර් 15

# පිදුම



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි පාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය-මහනුවර
2023.11.01

එකමත් එක කාලයක පුංචි ගෙදරක, සඳුනි කියලා ගැහැණු ළමයෙක් ජීවත් වුණා. සඳුනි පාසලේ වැඩ කටයුතු වලට වගේම පරිසරයටත් ගොඩක් ආදරෙයි.

සඳුනිගේ අම්මයි, තාත්තයි ජීවත්වුනේ හේන් ගොවිතැන් වැඩ කිරීමෙන්. අළුයම අවදිවන සඳුනිගේ දෙමාපියන් හේන් ගොවිතැන් කිරීමට උදෙන්ම නිවසින් පිටත් වෙනවා.



සඳුනි දිනපතා පාසල් යාමට කැමැත්තක් දක්වන දරුවෙකි. ඉතින් සඳුනි තනියම සූදානම් වී පාසල් යාමට පිටත් වෙයි. නිවසේ දී වගේම පාසලේදීත් සඳුනි කීකරු දරුවෙකි. ඇය යහළුවන් සමඟ සමඟියෙන් සිටින අතර ගුරුතුමිය උගන්වන දේ හොඳින් ඉගෙන ගනී.

දිනක් පාසලේ දී බුද්ධ ධර්මය පාඩමේ දී “ අපි දිනකට කාට හරි පුංචි හෝ උදව්වක් කරන්න ඕනි. ඒක හොඳ වැඩක්....,” යැයි ගුරුතුමිය කීවුවා. මෙය සඳුනිගේ සිතට හොඳින් දැනුණි. ඇය කාට හෝ උදවුවක් කිරීමට නිතර නිතර සිතීමට පුරුදු විය.



දිනක් ඇය පාසල් යාම සඳහා ගෙදරින් පිටත් වී පාර දිගේ ගමන් කරද්දී පුස් පැටියකුගේ කෙඳිරිලි හඬක් ඇසුණි.

ඤාව්....ඤාව්......ඤාව්.....සඳුනි වට පිට බැලුවා. ඒත් කවුරුත් පේන්න නෑ......

ඤාව්....ඤාව්......ඤාව්.....හඬ තවත් වැඩි විය.

ඤාව්....හඬ පාර ලඟ ඇති ගස උඩින් ඇසෙන බව ඇයට ඇසුණි. සඳුනි ගස උඩට එබිකම්කර බලන්නට විය.

අනේ.....පුංචි පුස් පැටියෙක් සඳුනිට ඉබේටම කියවුණි.



මම කොහොමද මෙයාට උදවු කරන්නේ... සඳුනිට සිතුණි.

මට ගසට නගින්න බැනේ... සඳුනිට දුක හිතුණි. සඳුනි වට පිට බැලුවා ... කවුරුත් උදව්වට නැහැ.

ඇත දිග ලීයක් තිබුණි. පොත් බෑගය පසෙක තබා අමාරුවෙන් ලීය ඔසවා ගසට තබන ලදී. ඒත් පූස් පැටියාට එයට ලඟා වීමට අපහසුය.



ඇය නැවතත් ලීය උස්සාගෙන පූස් පැටියා සිටි අත්ත දෙසට ලං කරන ලදී. පූස් පැටියා ලීය දිගේ පහලට ගැටුවේය.

"පුංචි පූස් පැටියෝ ඔයාට ගොඩක් බය හිතුනද?"

සඳුනි පූස් පැටියාගෙන් අසමින් පූස් පැටියාව බිමින් තිබ්බේ ය. පූස් පැටියා කැලේ දෙසට දිව ගොස් සඳුනි දෙස හැරී බලා නැවත කැලය දෙසට දිවුවේ ය.



සඳුනිට හරි සතුටුයි.

"මම අද අසරණ සතෙකුට අදවු කලා." සඳුනි ඒ ගැන සිතමින් පාසලට ගියේ ය.

සඳුනි පාසලට යන විට පාසල ආරම්භ වි තිබුණි. සඳුණි පාසලට දුවගොස් තම පන්තියට ඇතුලුවන දොර ලඟ සිටගත්තා.

පන්තියේ උගන්වමින් සිටි ගුරුතුමිය සඳුනි අසලට ගොස් "සඳුනි දැන්ද ඉස්කෝලෙ ආවේ.... ?, ඇයි ප්‍රමාද වුනේ....?" යැයි ඇසීය. "ප්‍රමාද වී පාසල් එන එක හොඳ පුරුද්දක් නොවේ...." යැයි පැවසීය.


4-E

සඳුනි පන්තියට ඇතුලු වී සිදු වු සියල්ල ගුරුතුමිය ඇතුළු පන්තියේ මිතුරු මිතුරියන්ට විස්තර කරන ලදි.

“සඳුනි ගොඩක් හොඳ වැඩක් තමයි කරලා තියෙන්නේ.. අසරණ සතෙකුට පිහිට වෙලා....”

ගුරුතුමිය සඳුනි සිදු කළ හොඳ ක්‍රියාව අගය කරමින් ඇගේ හිස අතගෑවේය.



# නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාප්තියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්න ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතිය නිර්මාතෘ

2023.11.01

**ISBN 978-624-206-644-8**

(Bar Code- 9 786242 066448)